Print Form | Reset Form

THE CHURCH OF
JESUS CHRIST
OF LATTER-DAY SAINTS

# Proof Cycles for Non-English Jobs

SALT LAKE GRAPHICS
50 EAST NORTH TEMPLE ST RM 2305
SALT LAKE CITY UT 84150-3233

Phone: 1-801-240-5473
Fax: 1-801-240-5117
E-mail: cur-slgraphics@ldschurch.org
or (GroupWise) SLGraphics

Item number 10662 408 | Language Sinhala

Job title Feb13 VTM / FPM

## Proof # 1 (Salt Lake Graphics)

Number of pages sent 5 | Date sent 12-10-12

☐ Revised text file requested for: | Date to be returned 12-12-12

Comments

## Checking Proof # 1 (Translation)

☐ OK to print as is.
☐ Make the corrections marked; then print. No further proof required.
☐ Make the corrections marked and send another proof.
☐ Revised text file sent.

Comments

☐ Reviewed by:
☐ Approved by: | Date

## Proof # (Salt Lake Graphics)

Number of pages sent | Date sent

☐ Revised text file requested for: | Date to be returned

Comments

## Checking Proof # (Translation)

☐ OK to print as is.
☐ Make the corrections marked; then print. No further proof required.
☐ Make the corrections marked and send another proof.
☐ Revised text file sent.

Comments

☐ Reviewed by:
☐ Approved by: | Date

## Proof # (Salt Lake Graphics)

Number of pages sent | Date sent

☐ Revised text file requested for: | Date to be returned

Comments

## Checking Proof # (Translation)

☐ OK to print as is.
☐ Make the corrections marked; then print. No further proof required.
☐ Make the corrections marked and send another proof.
☐ Revised text file sent.

Comments

☐ Reviewed by:
☐ Approved by: | Date

## Proof # (Salt Lake Graphics)

Number of pages sent | Date sent

☐ Revised text file requested for: | Date to be returned

Comments

## Checking Proof # (Translation)

☐ OK to print as is.
☐ Make the corrections marked; then print. No further proof required.
☐ Make the corrections marked and send another proof.
☐ Revised text file sent.

Comments

☐ Reviewed by:
☐ Approved by: | Date

© 2008 IRI. All rights reserved. 10/07. Printed in the USA. 06276



**සභාපති ඩීටර් එෆ්. උක්ඩෝෆ් විසිනි**
පළවෙනි සභාපතිත්වයේ
දෙවෙන උපදේශකවරයා

# පැකිළෙන ධර්මදූතයාට වචනයක්

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචිය ලෝකයාට ගෙනයාමට උන්වහන්සේගේ ගෝලයන්ට නිතරම වගකීමක් තිබින. (බලන්න මාර්ක් 16:15-16). එසේවුවද, සමහර අවස්ථාවලදී අපගේ මුඛය විවෘතකර අප වටා සිටින අයට අපගේ ආගම ගැන කීමට අපට අසීරුකමක් ඇත. සමහර සාමාජිකයන්ට සිය ආගම ගැන කීමට ස්වභාවිකවම හැකියාවක් ඇති අතර, අන් අයට එසේ කිරීමට මඳ පැකිළීමක්, නොගැලපීමක් හෝ අපහසුවට පත්වීමක් හෝ බියක් පවාද ඇත.

එම හේතුව නිසා සුභාරංචිය "සෑම කෙනෙකුටම" දේශනාකිරීමට ගැලවුම්කරුවාණන්වහන්සේ දුන් නියෝගය අනුගමනයකිරීමට ඕනෑම අයෙකුට පහසුවන කාරණා හතරක් යෝජනාකිරීමට මම කැමැත්තෙමි (ඩීසහගී 58:64).

## ආාලෝකයක් වන්න

මගේ ප්‍රියතම ප්‍රකාශයක් නිතරම අසිසියේ ශාන්ත ප්‍රැන්සිස් තුමාගේ ගුණවාචකයකි, "නිතරම සුභාරංචිය දේශනාකරන්න, අවශ්‍ය නම්, වචන පාවිච්චිකරන්න."[1] මෙම ප්‍රකාශයෙන් එය විශේෂයෙන් ප්‍රකාශ නොවුනද, අදහස එයයි. නිතරම බොහෝ බලවත් දේශනා කථා කර නැත.

අපි අවංකව අපගේ ප්‍රතිපත්තිවලට අනුකූලව ජීවත්වන්නේ නම්, ජනතාව එය දකිනු ඇත. අපි ප්‍රීතිය සහ සතුට පෙන්වන විට, ඔවුන් එය වඩාත් දකිනු ඇත.

සතුටින් සිටීම සෑම කෙනෙකුටම අවශ්‍යවේ. සභාවේ සාමාජිකයන්වන අපි සුභාරංචියේ ආලෝකය විහිදුවන විට, අපගේ සතුට ජනතාව දැක, දේවප්‍රේමය අපේ ජීවිතවල පිරී ඉතිරීයන බව ඔවුන් දකිනු ඇත. ඒ මන්දැයි දැනගැනීමට ඔවුන්ට අවශ්‍යවනු ඇත. අපේ රහස දැනගැනීම ඔවුන්ට අවශ්‍යවනු ඇත.

ඒ අනුව ඔවුන් මෙසේ අසනු ඇත, "ඔබ එතරම් සතුටින් සිටින්නේ මන්ද?" හෝ "නිතරම ඔබට එතරම් සුභාවාදී ආකල්පයක් තිබෙන්නේ මන්ද?" මෙම ප්‍රශ්නවලට පිළිතුරු, ඇත්ත වශයෙන්ම, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පිහිටුවූ සුභාරංචිය ගැන සංවාදයකට යොමුකරනු ඇත.

## සංවාදශීලී වන්න

ආගම පිළිබඳ මාතෘකාව ගැන කථාකිරීම—විශේෂයෙන්ම අපගේ මිතුරන් සහ ප්‍රේමනීය අය සමග—බියක්

සහ අභියෝගයක් ලෙස පෙනිය හැකිය. එය එසේ විය යුතු නැත. අපි මඳක් නිර්භීතව සහ සාමාන්‍ය බුද්ධිය පාවිච්චි කරමින් සමාන්‍ය කථාබහේදී ආත්මික අත්දැකීම් ගැන කීම හෝ සභා ක්‍රියාකාරකම් හෝ වැදගත් සිද්ධීන් ගැන කථාකිරීම පහසුවක් සහ සතුටක් විය හැකිය.

මගේ බිරිඳ, හැරියට්, මෙයට කදිම නිදර්ශනයකී අපි ජර්මනියේ ජීවත්වන කාලයේ, ඇය සභාවේ කටයුතු ගැන මිතුරන් හා අඳුනන අය සමග කථාකිරීමට යම් මාර්ගයක් සොයා ගනියි. උදාරණයක් ලෙස, ඇගේ සති අන්තය ගැන යමෙක් ඇගෙන් අසුවොත් ඇය මෙසේ කියයි, "මේ ඉරිදා අපේ සභාවේදී අපට සිත්ගන්නා අත්දැකීමක් ලැබුනා! 16 හැවිරිදි තරුණයෙක් මිනිසුන් 200ක සභාවක් ඉදිරියේ පිරිසිදු ජීවිතයක් ගතකරන අන්දම ගැන ලක්ෂණ කථාවක් කලා." නැතහොත්, "පොරෝනා 500ක් ගෙතු 90 හැවිරිදි කාන්තාවක් ඒවා ලෝකය වටා ජීවත්වන අවශ්‍යතා ඇති අයට දීම සඳහා සභාවේ මානුෂික ආධාර වැඩසටහනට බාරදුන්නා."

සාමාන්‍යයෙන්, වැඩිදුර දැනගැනීමට අවශ්‍යවන්නේ මෙම පණිවුඩය ඇසූ අයටය. ඔවුහු ප්‍රශ්න අසති. සුභාරංචිය ස්වාභාවික අන්දමින්, විශ්වාසයක් ඇතිව, අන් අයගේ සිත් නොරිදවා කථාකිරීමට අවස්ථා එමගින් ඇතිවන්නේය.

අන්තර් ජාලය සහ සමාජ මාධ්‍ය පැමිණීමත් සමගම, අද මේ දේවල් ගැන වෙනදාටත් වඩා සංවාදාත්මක අන්දමින් කථාකිරීමට පහසුය. අපට අවශ්‍ය වන්නේ එසේ කිරීමට ධෛර්‍යය පමණකි,

## කරුණාවෙන් පූර්ණවන්න

අවාසනාවකට මෙන්, එකඟ නොවීම ඉතා පහසුය. එය නිතරන සිදුවන්නේ අපි විවාදකරනවිට, විවේචනයකරන විට සහ දොස් තබන විටය. අපි මිනිසුන් සමග කෝපවී, අවිනීතව ඔවුන්ගේ සිත් රිදවන විට, ඔවුන්ට වැඩිපුරම දැනගැනීමට අවශ්‍යවන අන්තිම දෙය වන්නේ අප ගැනය. මිනිස්සු කී දෙනෙක් යමෙක් කී යම් දෙයක් නිසා සිත් රිදී හෝ අමනාපවී සභාවෙන් පිටවී ගොස් ඇතිද, ඔවුන් නැවත සම්බන්ධවී නැත්තේ ඇයි දැයි දැනගැනීම අපහසුය.

අද ලෝකයේ ගරුසරු නැතිකම වැඩිය. අන්තර්ජාලයේ නිර්නාමිකත්වය නිසා, විෂ සහිත හෝ අම්හිරි දේවල් කෙළින්ම ලබාගැනීම වෙනදාට වඩා ඉතා පහසුය. අපි අපගේ ආචාරසම්පන්න ක්‍රිස්තුස්වහන්සේගේ බලාපොරොත්තු සහගත, ඉතා උසස්, වඩාත් දයාවන්ත ප්‍රමිතීන් ඇති ගෝලයන් නොවෙමුද? ශුද්ධ ලියවිලි මෙසේ උගන්වයි, "ප්‍රඥාවෙන් ක්‍රියාකරපල්ලා, නුඹලා එකිනෙකාට උත්තරදිය යුතු කෙසේදැයි දැනගන්නා පිණිස නුඹලාගේ කථාව නිතර [ම] ලුණෙන් රසවත්ව, අනුග්‍රහයෙන් යුක්තව තිබේවා." (කොලෝසි 4:6).

අපගේ වචන දිවා අහස මෙන් පැහැදිළිව සහ කරුණාවෙන් පූර්ණව තිබීමේ අදහසට මම කැමැත්තෙමි. අපි මෙම සරල මූලධර්මය අදාලකරගන්නේ නම් අපගේ පවුල්, කොට්ඨාශ, ජාතීන්, සහ ලෝකය පවා කෙසේ තිබේදැයි ඔබට සිතාගත හැකිද?

## ඇදහිල්ලෙන් පූර්ණවන්න

අන් අය සුභාරංචිය පිළිගැනීමේදී සමහර අවස්ථාවලදී අපි කීර්තියෙන් හෝ චෝදනාවෙන් වැඩි කොටස අපි මත ගන්නෙමු. හැරී ඒම අප විසින් කිරීම ස්වාමීන්වහන්සේගේ අපේක්ෂාව නොවන බව මතකතබාගැනීම වැදගත්වේ.

හැරී ඒම අපගේ වචන තුලින් එන්නක් නොව ශුද්ධාත්මයාණන්ගේ ස්වර්ගීය මෙහෙකිරීම තුලින් එන්නකි. සමහර අවස්ථාවලදී සියල්ලම සිදුවන්නේ අපගේ සාක්ෂියේ එක් වාක්‍ය කණ්ඩයක් හෝ අත්දැකීමක් මගින් හදවතක් මෘදුකිරීමක් මගින් හෝ ආත්මයාණන්ගේ පෙළඹවීම් තුලින් උත්කෘෂ්ට සත්‍යයන් ගැන අත්දැකීමක් ලබාගැනීමට දොර විවෘතකිරීමෙනි.

සභාපති බ්‍රිගම් යං (1801–77) මෙසේ කීවේය, "කථිකත්වයක් හෝ ප්‍රසිද්ධියේ කථාකිරීමට දක්ෂතාවයක් නැති මිනිසෙක් 'මෝර්මන්ගේ පොත සත්‍ය බවත්, ජෝසප් ස්මිත් දෙවියන්වහන්සේගේ අනාගතවක්තෘවරයෙක් බවත් මම දනිමි'" යයි කියනු ඇසීමෙන් සුභාරංචිය සත්‍ය බව ඔහු දැනගත්බව කීවේය. සභාපති බ්‍රිගම් යං එම නිහතමානී සාක්ෂිය ඇසූ විට, "එම පුද්ගලයා තුලින් ශුද්ධාත්මයාණන්වහන්සේ මගේ අවබෝධය දීප්තිමත් කරමි [න්], ආලෝකය, මහිමය, සහ අමරණීයබව මා ඉදිරියේ [තැබූ] බවත් කීවේය."[2]

සොයුරු සොයුරියනි, ඇදහිල්ල ඇතිකරගන්න. ඔබ කථාකරන වචන වැඩිදියුණු කර ඒවා බලවත්කිරීමට ශුද්ධාත්මයාණන්ට පුළුවන. දෙවියන්වහන්සේ ඔබට කියන්නේ හැරී ඒමට සැලැස්වීමට නොව නමුත් ඔබගේ මුඛය විවෘතකිරීමටය. හැරී ඒම කිරීම ඔබට අයත් නැත—එය අයත්වන්නේ අසන තැනැත්තාට සහ ශුද්ධාත්මයාණන්වහන්සේටය.

## සෑම සාමාජිකයෙක්ම ධර්මදූතයෙකි

මගේ හිතවත් මිතුරනි, අද අපට කිසිදා නොතිබුන ලෙස අපගේ මුව විවරකර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සුභාරංචියේ ප්‍රීතිමත් ආරංචි අන් අය සමග බෙදාගැනීමට බොහෝ මාර්ග ඇත. සෑම කෙනෙකුටම මාර්ගයක් ඇත—පැකිළෙන ධර්මදූතයෙකුට පවා—මෙම ශ්‍රේෂ්ඨ කටයුතුවලට සහභාගිවීමට හැකිය. අප හැම කෙනෙකුටම අපගේම දක්ෂතාවයන් සහ ලැදියාවන් පාවිච්චිකර මෙම ලෝකය

ආලෝකයෙන් සහ සත්‍යයෙන් පිරවීමට සහයෝගය දිය හැකිය. අප එසේ කරන විට, අපට දැනෙන ප්‍රීතිය එන්නේ ප්‍රමාණවත් ඇඳහිල්ලක් සහ ධෛර්‍යයක් ඇතිව "සියලු කාලයන්හි දෙවියන්වහන්සේට සාක්ෂියක්ව නැගීසිටීමටය" (මොසායා 18:9).

**සටහන්**

1. St. Francis of Assisi, in William Fay and Linda Evans Shepherd, *Share Jesus without Fear* (1999), 22.
2. *Teachings of Presidents of the Church: Brigham Young* (1997), 67.

---

### මෙම පණිවුඩයෙන් ඉගැන්වීම

සාර්ථකව ඉගැන්වීමේ එක් ක්‍රමයක් නම්, "ඔබ උගන්වන අයට ඉලක්ක තැබීමට … දිරිගැන්වීමය, ඔබ ඉගැන්වූ මූලධර්ම අනුව ජීවත්වීමට එය ඔවුන්ට උපකාරවත්විය හැකිය" (*ඉගැන්වීමට වඩා ශ්‍රේෂ්ඨ කැඳවීමක් නැත* [1999], 159). මේ මාසයේදී එක් අයෙකුට හෝ වැඩි දෙනෙකුට සුභාරංචිය ඉගැන්වීමට ඉලක්කයක් තැබීමට ඔබ උගන්වන අයට යාච්ඤාවෙන් යුතුව ආරාධනාකිරීම ගැන සලකාබලන්න. දෙමාපියන්ට එම මාර්ග ගැන සාකච්ඡාකරන අතර, ලමයින්ට උදව්කළ හැකිය. පවුල් සාමාජිකයන්ගේ මොලය ශක්තිමත්කිරීමට හෝ නිරන්තර සංවාදවලට සුභාරංචිය එක්කරන මාර්ග නිරූපනයකර අනාගත සභා ක්‍රියාකාරකම්වලට මිතුරන්ට ආරාධනාකිරීමටද ඔබට හැකිය.

## තරුණඅය

### මිතුරෙක් සමග බෙදාගැනීම

**ඇඩ්රියානා වස්කුවේස් විසිනි**

එක් දිනක් මගේ සෙමනේරි පංතිය සඳහා අධ්‍යයනය කරන විට, මට අලංකාර සහ පැහැදිලි හැඟීමක් ඇතිවිය. ඊළඟ දවස සඳහා පාඩම කියවමින් සිටියදී, පසලේ මිතුරියකගේ මුහුණ මට පෙනුන අතර, ඇය සමග මගේ සාක්ෂිය බෙදාගතයුතු යයි මට තදබල හැඟීමක් ඇතිවිය.

මෙම හැඟීම පැහැදිලිව තිබුනද, මම බියවීමි. මගේ මිතුරිය මාව ප්‍රතික්ෂේපකරතැයි මම කණගාටුවීමි. විශේෂයෙන්ම සභාවට බැඳීමට කැමැත්තක් ඇති ගැහැණු ලමයෙක් ලෙස ඇය නොපෙනුන නිසාය.

තරුණ කාන්තා ප්‍රධාන සභාපතිත්වයේ මේරි එන්. කුක් සොයුරියගේ කථාවක් ගැන මම සිතුවෙමි. එතුලින් වෙහෙසවී වැඩකිරීමටත් නිර්භීතවීමටත් ඇය අපට අභියෝග කළාය.[1] මට එසේවීමට අවශ්‍යවූ නිසා, මම මෙම ගැහැණු ලමයාට ලිපියක් ලියමින් සභාවේ සත්‍යතාවය ගැන සහ මෝර්මන්ගේ පොතට මා දක්වන ආදරය ගැනද සහතික කළෙමි. ඊළඟ දිනයේ මෝර්මන්ගේ පොතක් මගේ ලිපියද සමග මම ඇගේ බෑගයට දැමුවෙමි.

මගේ පුදුමයට මෙන්, මගේ මිතුරිය සුභාරංචියට ඉතා ලැදිවූවාය. එදා සිට පටන්ගෙන, මෝර්මන්ගේ පොත කොපමණ දුරට අධ්‍යයනය කර තිබේ දැයි ඇය මට කියයි. සති කිහිපයකට පසුව, මම ඇයව ධර්මදූතයන්ට හඳුන්වා දුනිමි, ඉතා ඉක්මණින්ම, ශුද්ධාත්මයාණන්ගේ තහවුරුකිරීම මගින් ඇය ඉගෙනගත් දේවල් සත්‍ය බව ඇය දැනගත්තාය. ඇයගේ හැඟීම් ගැන අපට කියනවිට ධර්මදූතයන් සමග මමද හැඬුවෙමි. මගේ මිතුරිය ඉක්මණින්ම බෞතීස්මවූ අතර, ඇය තුල ඇතිවූ වෙනස්වීම් ගැන ඇගේ දෙමාපියෝ මවිතයට පත්වූහ.

ඇගේ ජීවිතයට සුභාරංචිය ලබාදීමට උපකාරවීමේදී මට ඇතිවූ බිය ජයගැනීමට හැකිවීම ගැන මම ඉතා සතුටුවීමි.

**සටහන**

1. බලන්න මේරි එන්. කුක්, "Never, Never, Never Give Up!" *ලියහෝනා,* මැයි 2010, 117–19.

## ළමයි

### අන් අයට ආලෝකයක් වීමට මට හැකිය

අන් අයට ආලෝකයක්වීම සඳහා, අපගේ වචන "දිවා අහස මෙන් පැහැදිළිව සහ කරුණාවෙන් පූර්ණව" තිබිය යුතු බව සභාපති උක්ඩෝෆ් කියයි. අපගේ වචන ප්‍රීතිමත්, අවංක සහ කාරුණික විය යුතුය. අන් අයට ආලෝකයක් වීමට ඔබට කුමක් කළ හැකිද? පවුල් සාමාජිකයන්ට හෝ අන් අයට කීමට ඔබ සැලසුම්කරන දේවල් පහක් ඔබගේ ජර්නලයේ ලිවීමට ඔබට හැකිය.

© 2013 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි. ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/12. පරිවර්තන අනුමැතිය: 6/12. *First Presidency Message, February 2013* පරිවර්තනයයි. Sinhala. 10662 408

# ස්වාමීන්වහන්සේ වෙතට හැරීඒම

*මේ ලිපිය යාච්ඤාවෙන් යුතුව අධ්‍යයනයකර, අදාල පරිදි, ඔබ බැහැදකින සොයුරියන් හා එය බෙදාගන්න. ඔබගේ සොයුරියන් ශක්තිමත්කිරීමට සහ සහන සමිතිය ඔබේම ජීවිතයේ ක්‍රියාකාරී කොටසක් කරගැනීමට උපකාරවත්වන ප්‍රශ්න අසන්න. වැඩිදුර තොරතුරු සඳහා යන්න reliefsociety.lds.org.*

**ඇදහිල්ල, පවුල, සහනය**

සභාවේ අළුත් සොයුරියන්—සහන සමිතියට ඇතුල්වන තරුණ කාන්තාවන්, ක්‍රියාකාරකම්වලට නැවත එන සොයුරියන්, සහ අළුතින් හැරීඑන අයද ඇතුළු සියල්ලන්ටම—බැහැදැක උගන්වන ගුරුවරියන්ගේ සහයෝගය අවශ්‍යවේ. "හැරී එන අය නවතාගැනීමට සහ අඩු-ක්‍රියාකාරී සාමාජිකයන් පූර්ණ කියාකාරීත්වයට ගෙන ඒමට සාමාජික සහභාගිකම අත්‍යාවශ්‍යවේ" යයි ප්‍රේරිතවරුන් දොළොස්දෙනාගේ වැඩිහිටි එම් රසල් බලාඩ් කීවේය. "මෙම දර්ශනය ග්‍රහනයකරගන්න එනම් සහන සමිතිය … සභාවේ අපට තිබෙන බොහෝ බලවත් මිත්‍රත්ව මූලාශ්‍රය [න්] ගෙන් [එකක්] බවට පත්විය හැකිය. උගන්වා නැවත ක්‍රියාකාරීවන අය ළඟට කල් ඇතිව ගොස්, ඔබගේ සංවිධානය තුලින් ඔවුන්ට ප්‍රේමකර සභාවට ගෙන්වන්න."[1]

සහන සමිතියේ සාමාජිකයන් ලෙස, අළුත් සමාජිකාවන්ට සභාවේ මූලික ප්‍රතිපත්ති ඉගෙනගැනීමට උදව්කිරීමට අපට පුළුවන. ඒවා නම්,

- කථාවක් කිරීම
- සාක්ෂිය දැරීම
- උපවාස නීතිය අනුව ජීවත්වීම
- දසයෙන් කොටස සහ වෙනත් දීමනා ගෙවීම
- පවුල් ඉතිහාස වැඩවලට සහභාගිවීම
- ඔවුන්ගේ මියගිය මුතුන්මිත්තන් වෙනුවෙන් බව්තීස්මය සහ ස්ථිරකිරීමේ කටයුතු කිරීම

"අළුත් සාමාජිකාවන්ට සභාව තුල පහසුවක් සහ පිළිගැනීමක් ඇතිකිරීම අවධානශීලී මිතුරියන්ට අයත් දෙයකි," යයි වැඩිහිටි බලාඩ් කීවේය.[2] අප සියල්ලන්ටම, නමුත් විශේෂයෙන්ම බැහැදැක උගන්වන ගුරුවරියන්ට, අළුත් සාමාජිකාවන් හා මිත්‍රත්වයක් ගොඩනගා "ස්වාමීන්වහන්සේ වෙත ස්ථිරව හැරී ඒමට" (ඇල්මා 23:6) ඔවුන්ට උපකාරකිරීමට වැදගත් වගකීමක් ඇත.

### *ශුද්ධලියවිලි වලින්*

2 නෙපී 31:19–20; මොරෝනි 6:4

### *අපගේ ඉතිහාසයෙන්*

"හැරී එන්නන්ගේ සීඝ්‍ර වැඩිවීමත් සමගම," යයි සභාපති ගෝර්ඩන් බී. හින්ක්ලි (1910–2008) කීවේය, "ඔවුන්ගේ මාර්ගය සොයාගැනීමට සහායවීම සඳහා අපි ඔවුන්ට ප්‍රමාණවත් උත්සාහයක් සෑහෙන පරිදි ලබාදිය යුතුය. ඔවුන් හැම කෙනෙකුටම කාරණා තුනක් අවශ්‍යවේ: මිතුරෙක්, වගකීමක්, සහ 'යහපත් දේව වචනයෙන් පෝෂණයකිරීමක්ය' (මොරෝනි 6:4)."[3]

බැහැදැක උගන්වන ගුරුවරියන්ට ඔවුන් රැකබලාගන්නා අයට උපකාරකිරීමට හැකියාවක් ඇත. මිත්‍රත්වයට නිතරම පළමු තැන එන්නේය, එය සහන සමිතියේ තරුණ සොහොයුරියකට සිදුවිය, ඇය වැඩිහිටි සොහොයුරියකගේ බැහැදැක උගන්වන ගුරුවරිය වූවාය. ඔවුන් පිරිසිදුකිරීමේ ව්‍යාපෘතියක එකට වැඩ කරන තුරු, ඔවුන්ගේ මිත්‍රත්වය ගොඩනැගීම සිදුවූයේ බොහෝ සෙමින්ය. පසුව ඔවුහු මිතුරන් බවට පත්වූහ. ඔවුන් දෙදෙනාම "යහපත් දේව වචනයෙන්." පෝෂණයවූහ.

සභාපති ජෝසෆ් ෆීල්ඩින් ස්මිත් (1876–1972) මෙසේ කීවේය, සහන සමිතිය "පොළොව මත දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ඉතා වැදගත් කොටසක් වන අතර … එය ඇදහිලිමත් සාමාජිකාවන්ට අපගේ පියාණන්ගේ රාජ්‍යයේ සදාකාලික ජීවනය ලබාගැනීමට උපකාර කරන්නේය."[4]

සටහන්

1. එම්. රසල් බලාඩ්, "Members Are the Key," *ලියහෝනා,* සැප්තැ. 2000, 18.
2. එම්. රසල් බලාඩ්, *ලියහෝනා,* ෆසැප්තැ. 2000, 17.
3. ගෝර්ඩන් බී. හින්කලි, "Every Convert Is Precious," *ලියහෝනා,* පෙබ. 1999, 9.
4. ජෝසෆ් ෆීල්ඩින් ස්මිත්, ***Daughters in My Kingdom: The History and Work of Relief Society*** තුලිනි (2011), 97.

### *මට කුමක් කළ හැකිද?*

**1.** අපි අපගේ සොහොයුරියන්ට සේවයකරන විට අපට මගපෙන්වීමට ආත්මයාණන්ගෙන් ඉල්ලීමට මගේ සහායිකාව වෙනුවෙන් මා යාච්ඤාකළ යුතුද?

**2.** අපි රැකබලාගන්නා එක් එක් සොහොයුරියට අපි අවංකව සේවයකරන බව පෙන්වීමට අපි ඇයට කුමන අන්දමින් සේවය කළ යුතුද?

© 2013 Intellectual Reserve, Inc. විසිනි. සියලු හිමිකම් ඇවිරිණි.

ශ්‍රී ලංකාවේ මුද්‍රණයකරන ලදී. ඉංග්‍රීසි අනුමැතිය: 6/12. පරිවර්තන අනුමැතිය: 6/12. *Visiting Teaching Message, February 2013* පරිවර්තනයයි. Sinhala. 10662 408